# පටුන


හැඳින්වීම........................................................................................................ 3-5

දැක්ම , මෙහෙවර, ආයතන සංයුතිය........................................................................ 6

මූලික අපේක්ෂාවන්, ප්‍රධාන උපාය මාර්ග සංවර්ධන අරමුණු, කාර්ය සාධන දර්ශක... 7

2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රමුඛතම සංවර්ධන වැඩ සටහන්...................... 8-13

2014.12.31 දිනට කාර්ය මණ්ඩලය.......................................................................... 14-15

**ආංශීය කාර්ය සාධනය**

පාලන අංශය...................................................................................................... 15-17

ගිණුම් අංශය...................................................................................................... 17-19

අභ්‍යන්තර විගණන අංශය................................................................................... 19-21

සැලසුම් අංශය.................................................................................................... 21-22

සංවර්ධන අංශය.................................................................................................. 23

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය.............................................................................. 24-27

ජාතික කාන්තා කමිටුව........................................................................................ 28-29

ළමා ලේකම් කාර්යාලය........................................................................................ 29-31

*ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ*

*2014 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව*

*2002 සැප්තැම්බර් 12 දිනැති*

*රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි*

*උපදෙස් පරිදි පිළියෙල කර ඇත.*

# හැදින්වීම.

ශ්‍රී ලාංකේය කාන්තා හා ළමා පරපුරේ උන්නතිය උදෙසා ශ්‍රී ලංකා ප්‍රාජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.11.22 දිනැති අංක 1681/3 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් පවරා දෙන ලද කාර්යයන්, මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ දක්වා ඇති කාර්යයන්,උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශයන්ද සමඟ ගලපමින් ක්‍රියාවට නැංවීම උදෙසා අදාළ පරිදි අමාත්‍යාංශය වෙත සුවිශේෂි කාර්යයභාරයක් පැවරි ඇත.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් පිටුදැකීම පිළිබඳ සම්මුතියේ සඳහන් කරුනු ඇතුළත්වූ කාන්තා ප්‍රඥප්තිය, පාදක කරගෙන ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නීති සම්පාදනය, ප්‍රතිපත්ති සකස් කිරීම,වැඩ සටහන් මෙහෙයවීම යන කාර්යයන් අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන විසින් සාර්ථකව ක්‍රියාවට නංවා ඇත.

තවද, 2014 අය වැය යෝජනා අනුව වෙන්වු විශේෂ ප්‍රතිපාදන යටතේ කාන්තා ව්‍යවසායකත්වය යටතේ පවත්වාගෙන යනු ලබන කුඩා හා මධ්‍යම පරිමාන ව්‍යාපාරවල සාර්ථකත්වය හා ඊට සංවේදී බවක් ඇති කිරීම සඳහා රජයේ ආයතන හා මුල්‍ය ආයතන මැදිහත්ව රු.250,000/- ක් දක්වා පොලී රහිත "ලිය ඉසුර" නමින් වූ ණය සහතික ක්‍රමය ප්‍රාදේශීය සංවර්ධන බැංකු හරහා ක්‍රියාත්මක කිරීම හා හිංසනයට ලක්වන කාන්තාවන් හා අපයෝජනයට ලක්වන ළමුන් සඳහා රැකවරණ නිවාස පුළුල් කිරීම, පොලිස් ස්ථානවල පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ස්ථාපිත කිරීම,දිවා සුරකුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා උපදේශන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම යන කාර්යයන් සුවිශේෂි අයුරින් ඉටුකර ඇත.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ ළමා හා කාන්තා සංවර්ධන ඒකක පිහිටුවීම තුලින් ප්‍රජාව වෙත කාර්යක්ෂම සේවාවක් සැපයීමත් අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ යෙදී සිටින කාර්යය මණ්ඩලයට පහසුකම් සැපයීමත් සිදු කරන ලදි. කාන්තා දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම, වැන්දඹු හා ගෘමූලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ස්වංරැකියා අවස්ථා උත්පාදනය හා ඒ සඳහා පෙළඹවීමද, මුල් ළමාවියේ දරුවන්ගේ පෝෂණය නංවාලීම සඳහා වන කිරිවීදුරුව වැඩ සටහන, බන්ධනාගාරගත ළමුන් නියමිත දිනයන් සඳහා උසාවිය වෙත රැගෙන යාමට හා ඊමට බස්රථ ලබා දීම ,රාජ්‍ය ,රාජ්‍ය නොවන හා පෞද්ගලික යන සියලු අංශවල සාමූහික දායකත්වයෙන් හා සම්බන්ධීකරණයෙන් ළමා අපයෝජන වැළැක්වීම සඳහා Angel's Network ක්‍රියාත්මක කිරීම හා 1929 ළමා උපකාරක දුරකථන සේවාව හා 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව ශක්තිමත් කිරීම මෙම වසරේද සාර්ථකව සිදු කරන ලදි.

2015 වර්ෂයේ මුල් කාල වකවානුවේදි අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කිරීමට නියමිත කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් දුරුකිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට අදාලව 8 වන කාලීන වාර්තාව සකස් කිරීමත් ජනාධිපති ලේකම් කාර්යාලයේ ජාතික ප්‍රතිපත්ති ලේකම් කාර්යාලය හා එක්ව අමාත්‍යාංශයීය කාර්යය මණ්ඩලයේ සෞඛ්‍ය හා පෝෂණය නංවාලීම සඳහා උත්තම ශ්‍රම පූජා වැඩ සටහන ක්‍රියාත්මක කිරීමත් මෙම වර්ෂයේ දී සිදු කරන ලදි.

## ප්‍රතිපත්ති ප්‍රකාශය

- කාන්තාවන් අතර ස්වයංරැකියා සහ අතිරේක ආදායම් මාර්ග වැඩි දියුණු කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සඳහා කාන්තා ව්‍යවසාය සංවර්ධන අරමුදලක් පිහිටුවීම.
- ආර්ථිකමය සහ වෘත්තීයමය තොරතුරු ලබා ගැනීමට පහසුවන පරිදි කාන්තා දත්ත බැංකුවක් ආරම්භ කිරීම.
- කාන්තාව පවුලේ ප්‍රධාන වගකීම දරන්නා වන අවස්ථාවලදි ඇය ගෘහ මූලිකයා ලෙස පිළිගැනීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැලසීම තුළින් ඇතැම් අවස්ථාවලදි කාන්තාවන් මුහුණපාන පරිපාලනමය හෝ නීතිමය දුෂ්කරතාවයන් ඉවත් කිරීමට කටයුතු කිරීම.
- දේශපාලන හා පරිපාලන ව්‍යුහයන් තුළ කාන්තා නියෝජනය වැඩි කිරීමට පියවර ගැනීම.
- උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති ගැටුම් මත හෝ 1987-89 භීෂණ සමය හේතු කරගෙන හෝ වෙනත් ස්වභාවික හේතූන් නිසා ගොඩනැගුණු කාන්තා මූලිකත්ව පවුල්වල ආර්ථික සංවර්ධනය හා සුරක්ෂාව ලබා දීම සඳහා ඔවුන්ට සුදුසු ආර්ථික ක්‍රියාවලියකට යොමුවීම සඳහා රු.ල.2 කට නොවැඩි ණය මුදලක් සහන පොළියක් යටතේ ලබා දීමට කටයුතු කිරීම.
- ගමේ තීන්දු තීරණ ගන්නා ජන සභාවේ කාන්තා නියෝජනය අනිවාර්යය කිරීම මඟින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම්වලදි කාන්තා දායකත්වය ඉහළ නැංවීම.
- රටේ සියලු දරුවන්ගේ ආරක්ෂාව සහ රැකවරණය සම්පූර්ණයෙන්ම සහතික කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියට අනුබද්ධ කර පොලිස් ළමා කාර්යාංශයක් පිහිටුවීම.
- දරුවන්ට පමණක් වෙන් වූ ඔවුන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා වන පරිදි කටයුතු කරන අධිකරණ පද්ධතියක් ආරම්භ කිරීම.
- වයස අවු 18 සම්පූර්ණ වූ නමුත් නිසි රැකවරණයක් අහිමි වන අනාථ දරුවන් විවාහය තෙක් අදාළ ළමා නිවස තුළම රැඳී සිටීමට හෝ පුරප්පාඩු අනුව එම කාර්ය මණ්ඩලවලට බඳවා ගැනීමට හැකිවන පරිදි නීති සංශෝධනය කිරීම.
- මව හෝ පියා බන්ධනාගාර ගත වූ පවුල්වල දරුවන්ගේ රැකවරණය සහතික කිරීම සඳහා වන ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම.
- ළමා ලේකම් කාර්යාලය ළමා ආරක්ෂක අධිකාරිය මෙන් පුළුල් බලතල සහිත අධිකාරියක් බවට පත් කිරීම.
- රටපුරා ව්‍යාප්ත රජයේ සහ පෞද්ගලික අංශයේ පෙර පාසැල්, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ඉහත අරමුණු ජය ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීමේ වගකීම එම නව අධිකාරියට පැවරීම.
- එකී නියාමයන්ට අනුව ළදරු පාසල් පවත්වා ගෙන යාම සඳහා රජයෙන් ආධාර මුදලක් ලබා දීම සහතික කිරීම.
- පාසල්වලට ඇතුළත් කරන කිසිම ළමයෙකුට ආර්ථික හේතු මත පාසලෙන් ගිලිහී යාමට ඉඩකඩ නොතබා ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ළමා සුරැකුම් අරමුදල තර කොට ශිෂ්‍යත්ව ලබා දීමේ ක්‍රමය පුළුල් කිරීම.

# උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ .

නිර්දේශ අංක : 9.77- කළින් ළමා සොල්දාදුවන් ලෙස කටයුතු කළ දරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා ද පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ගේ ප්‍රජා මූලික විශෝධන වැඩසටහන ස්වේච්ඡා සංවිධාන හා සිවිල් සමාජ සංවිධානවල සහය ලබා ගනිමින් ක්‍රියාවට යොදා ගැනීම.

නිර්දේශ අංක : 9.80 - පුද්ගලික අංශයේ සහයෝගය ඇතිව ගැටුම්වලින් විපතට පත් ප්‍රදේශවල රැකියා අවස්ථා සුලබ කිරීම. පාසල් යාම මගහැරුණු කළින් ළමා සොල්දාදුවන්ව සිටි දරුවන් නැවත පාසල් යැවීම සඳහා උනන්දු කිරීම සහ ප්‍රයෝජනවත් රැකියාවක නිරත වන අතරේ විධිමත් අධ්‍යාපන අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා පහසුකම් සැලසීම.

නිර්දේශ ; 9.87- කාන්තාවන්ගේ, විශේෂයෙන් බොහෝවිට තමන්ගේ පවුල්වල ගෘහමූලිකයන් බවට පත්වූ වැන්දඹුවන්ගේ දැඩි ආර්ථික දුෂ්කරතා අඩු කිරීම සඳහා ජීවනෝපාය අවස්ථා සහ ආදායම් උත්පාදන අවස්ථා ලබා දීම.

නිර්දේශ අංක : 9.88 - මෑතකදි යළි පදිංචි කරවන ලද ආබාධිත තත්ත්වයට පත් වූ වැන්දඹු මව්වරු මුහුණ දෙන ගැටළු වලට විසඳුම් ලබාදීමටත්, ක්ෂිතියට (Trauma) ගොදුරු වී ඇති තැනැත්තියන්ගේ මනෝභාවික සහ අධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලනු පිණිසත් අදාළ ජාත්‍යන්තර ආයතන, සිවිල් සමාජ සංවිධාන, ප්‍රජා මට්ටමේ සංවිධාන සහ සහාය කණ්ඩායම්වල සේවය ලබා ගැනීමට සහ සහාය කණ්ඩායම්වල සහභාගිත්වය සඳහා පහසුකම් සැලසීම.

නිර්දේශ අංක:9.89 - දිග්ගැසුණු ගැටුම් නිසා විධිමත් අධ්‍යාපනය නොකඩවා පවත්වාගෙන ලබාගැනීමට නොහැකි වූ කාන්තාවන් සඳහා අවස්ථා සහ තෝරාගැනීමේ විභවතාවන් ලබාදීම මගින් රැකියා සොයාගැනීමට සහ/හෝ ජීවනෝපාය කටයුතුවල නියැලීමට අවස්ථාව ලබාදීම.

නිර්දේශ අංක : 9.90 - මුළු රටපුරා, විශේෂයෙන් යුද්ධයෙන් විපතට පත් ප්‍රදේශවල කාන්තාවන්ට සුරක්ෂිත පරිසරයක ජීවත් වන බවත්, මූලික මිනිස් අභිමානය සුරක්ෂිත වන බවත් හැඟෙන ආකාරයේ සුරක්ෂිත සහ සහෝපකාරී වාතාවරණයක් නිර්මාණය කිරීම.

නිර්දේශ අංක :9.93- පාසල්, පාසල් සැපයුම්, ගුරුවරුන්, ශිෂ්‍යත්ව වැනි භෞතික,මානව, මූල්‍ය සහ වෙනත් සහායන් ළමුන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ලබාදීමට ප්‍රමුඛත්වය ලබා දීම. ළමාරක්ෂක සේවා සපයන නිවාස සහ අනාථ නිවාස සඳහා නොකඩවා සහය ලබාදීම. අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීමේ නිර්දේශය යටතේ පූර්ව ළමාවිය මධ්‍යස්ථාන සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීම සහ ඒවාට නොකඩවා පහසුකම් ලබා දීම සිදුකළ හැකිය.

නිර්දේශ අංක ; 9.94 - ගැටුමේ ප්‍රතිවිපාක හේතුවෙන් සහ තමන්ගේ ළබැඳියන් අහිමි වීමෙන් ක්ෂිතියට (Trauma) සහ වෙනත් මනෝ විද්‍යාත්මක ව්‍යාකූලතාවන්ගෙන් පීඩා විඳින දරුවන් හඳුනාගැනීම සහ වෘත්තීය උපදේශනය ඇතුළු සුවිශේෂී ආකාරයේ සත්කාර කාර්යයන් සම්පාදනය කිරීම. මෙවැනි දරුවන් විධිමත් අධ්‍යාපන ක්‍රම තුළින් මෙන්ම එම ප්‍රදේශවල කටයුතු කරන ප්‍රජා, සිවිල් සමාජ කණ්ඩායම් මගින් හඳුනාගත හැකි අතර , කාන්තා මූලික පවුල්වල සිටින දරුවන් ද එම ප්‍රවර්ගය යටතේ හඳුනා ගත හැකිය.

නිර්දේශ අංක ;9.95- පාසල් සඳහා පහසු ප්‍රවේශය, මනා සෞඛ්‍ය සේවා පහසුකම්, ක්‍රීඩා උද්‍යාන සහ ළමා උද්‍යාන වැනි විනෝද පහසුකම් සම්පාදනය මගින් විපතට පත් ප්‍රදේශවල ළමා මිතුරු පරිසරයක් ඇති කිරීම සඳහා උත්ප්‍රේරණය ලබා දීම.


## දැක්ම

ළමයින් හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ ආරක්ෂාව තහවුරු කෙරෙන ඔවුනට හිතකර ,සංවේදී, සමාජයක් බිහි කිරීම.

## මෙහෙවර

ශ්‍රී ලාංකීය සමාජ සංස්කෘතික පදනම තුළ, ළමුන් හා කාන්තාවන්ට අදාළ ජාත්‍යන්තර ප්‍රඥප්තීන් ද සැලකිල්ලට ගෙන, ඔවුන්ගේ අයිතිවාසිකම්, පූර්ණ සංවර්ධනය ආරක්ෂාව හා සහභාගිත්වය තහවුරු කෙරෙන අන්දමේ ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් සහ ඇගයීම් සිදු කරන ජාතික යාන්ත්‍රණය ලෙස ක්‍රියාත්මක වීම.

## ආයතනික සංයුතිය



## මූලික අපේක්ෂාවන්

- ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය උදෙසා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම.
- කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය උදෙසා ජාතික සැලැස්මක් සකස් කිරීම.
- ළමා හා කාන්තා සංවර්ධනය සඳහා යාන්ත්‍රණයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
- රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන, විදේශ ආයතන සහ පෞද්ගලික අංශ සම්බන්ධීකරණය කරමින් ළමා හා කාන්තා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ළමා හා කාන්තා ආරක්ෂණය සහ සංවර්ධනය සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශයෙන් සහ එයට අයත් නියෝජිත ආයතන මඟින් සිදු කරනු ලැබූ ආරක්ෂණ සහ සංවර්ධන වැඩ සටහන් අධීක්ෂණය කිරීම.
- ළමුන් හා කාන්තාවන් සම්බන්ධව ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටින සියලුම ජාත්‍යන්තර සම්මුතීන් හා එකඟතාවයන් සඳහා නීති ,ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය.
- ළමා අපයෝජනය පිටු දැකීමෙහිලා අවශ්‍ය නෛතික හා ජාතික ප්‍රතිපත්තීන්ගෙන් සැදි පරිසරයක් ස්ථාපිත කිරීම.

## උපාය මාර්ග සංවර්ධන අරමුණු

1. ඉහළ ගුණාත්මක භාවයකින් යුතු මුල් ළමාවිය සංවර්ධන හා රැකවරණ සේවාවක් තහවුරු කිරීම.
2. නිවාසගත ළමුන්ගේ සුබසාධනය උදෙසා අයිතිවාසිකම් තහවුරු කිරීම හා ඔවුන් සමාජගත කිරීම.
3. ළමා අපයෝජන වැළැක්වීම හා අවම කිරීම.
4. අනාරක්ෂිත කාන්තා පවුල් සංවර්ධනය.
5. ළමුන්ගේ හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නීති හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම.
6. ශ්‍රී ලංකාව බැඳී සිටින ජාත්‍යන්තර සම්මුතීන්ට ගැලපෙන දේශීය ළමා හා කාන්තා සංවර්ධන ක්‍රමෝපායන් ස්ථාපිත කිරීම.

## ප්‍රධාන කාර්ය සාධක දර්ශක

01. 2015 වන විට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සියලුම පෙර පාසල් හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන අවම ප්‍රමිතීන් සපුරා තිබීම.
02. 2015 වන විට ශ්‍රී ලංකාවේ ළමා නිවාසවලින් 90% ළමා මිතුරු පරිසරයකින් යුතු ඒ ශ්‍රේණියේ නිවාස බවට පත් කිරීම.
03. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකක ශක්තිමත් කිරීම තුළින් ළමා අපයෝජනය වැළැක්වීම හා අවම කිරීම.
04. වැන්දඹු හා ගෘහමූලික කාන්තා පවුල්වලින් 50% කට නව ජීවනෝපාය සංවර්ධන අවස්ථා ඇති කිරීම.
05. ළමුන්ගේ හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නීති ප්‍රතිපත්තිමය මැදිහත්වීම ප්‍රවර්ධනය කිරීම.

# 2014 වර්ෂයේ සිදු කළ ප්‍රමුඛතම සංවර්ධන කාර්යයන්

## 2014 වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

### ➢ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ස්ථාපිත කිරීම

ළමා අපයෝජනය හා කාන්තා හිංසන වැළැක්වීම සඳහා පොලීසිය මඟින් ඉටු කරන කාර්ය භාරය ශක්තිමත් කිරීම සඳහා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ස්ථාපිත කරන ලදි.

පදවිය,කැබිතිගොල්ලෑව,ගල්කිරියාගම,අරලගංවිල,හිඟුරක්ගොඩ,බිබිල,සියඹලාණ්ඩුව,කන්දකැටිය,කාත්තන්කුඩි,වාලච්චේන,මහඔය,තිරුක්කෝවිල්,පානම,මූතූර්,කන්තලේ,යාපනය,කයිට්ස්,මුලතිව්,මල්ලාවි,මුලන්කාවිල්,තලෙයිමන්නාරම්,මඩු,බිංගිරිය,ගල්ගමුව,පුත්තලම, කොත්මලේ යන පොලිස් ස්ථානවල ඒකක ස්ථාපිත කිරීම, එම ඒකක සඳහා කාර්යාලීය උපකරණ හා සෙල්ලම් මිදුල් සකස් කිරීම, මෙම වසරේ දී ආරම්භකරන ලදි.මේ සඳහා රු.මි.107.34 ක් වැය කර ඇත.

### ➢ කාන්තා රැකවරණ මධ්‍යස්ථාන ඉදි කිරීම

හිංසන ක්‍රියාවන්ට ලක් වූවන් ආරක්ෂා කිරීම,පුනරුත්ථාපනය කිරීම, ඔවුන්තුල ආත්ම විශ්වාසය ගොඩනැගීම හා බල ගැන්වීම පෙරදැරිව ඔවුන් සඳහා උපකාරී සේවාවන් නංවාලීමත්,හා කාන්තාවන්ට එරෙහි සාහාසික ක්‍රියාවනට පිළියම් යෙදීම සඳහා කාන්තා රැකවරණ මධ්‍යස්ථාන මර්දන්කර්නී,මන්මුනේ උතුර,මැරිටයිම් පත්තු යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉදිකිරීම් කටයුතු ආරම්භකර ඇත.

### ➢ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හි ළමා හා කාන්තා සංවර්ධන ඒකක පිහිටුවීම

ළමා හා කාන්තා සංවර්ධනය සඳහා වන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා මෙම ඒකක ප්‍රාදේශිය ලේකම් කාර්යාල තුළ ස්ථාපිත කිරීම ආරම්භ කරන ලදි.

ළමුන් හා කාන්තාවන් පිළිබඳ රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ දී මනා සම්බන්ධීකරණයකින් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සමීප අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල තුළ ළමා හා කාන්තා විෂයට අදාළ කටයුතු ඒකාබද්ධ කිරීමෙන් කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ඇති කිරීම මෙයින් අපේක්ෂා කරයි. මේ සඳහා රු.මි.31.542 වැය කර ඇත.

## ➢ ළමා රැකවරණ නිවාස ඉදිකිරීම

අත්හල, අනාථ හා අයිතිවාසිකම් කඩ කිරීමට ලක්වන දරුවන්ගේ රැකවරණය හා සුබ සාධනය තහවුරු කිරීම සඳහා පහත සඳහන් පරිදි ළමා රැකවරණ නිවාස ඉදිකර ඇත.

ඌව පළාත - බාලක රැඳවුම් නිවාසය ඉදි කිරීම, නැගෙනහිර පළාත - ළමා ආරක්ෂිත නිවාසය ඉදිකිරීම,සබරගමුව පළාත- ගැහැණු ළමුන්ගේ රැඳවුම් මධ්‍යස්ථානයේ අනාරක්ෂිත වැට ඉදි කිරීම,වයඹ පළාත- රජයේ රැඳවුම් බාලිකා නිවාසය ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම,උතුරු පළාත - ගැහැණු ළමුන්ගේ රැඳවුම් මධ්‍යස්ථානය ඉදි කිරීම, මධ්‍යම පළාත, ගැහැණු ළමුන්ගේ රැඳවුම් නිවාසය ඉදි කිරීම, උතුරු මැද පළාත ගැහැණු ළමුන්ගේ රැඳවුම් නිවාසය ඉදි කිරීම හා ගැහැණු ළමුන්ගේ සහතික කළ පාසල ඉදි කිරීම.මේසඳහා රු.මි.122.41 ක් වැය කර ඇත.

## ➢ දිවා සුරකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම

මුල් ළමාවිය දරුවන්ගේ ආරක්ෂාව සහ රැකවරණය තහවුරු කිරීම සඳහා පච්චිලෙපල්ලි,මඩකලපුව, පොළොන්නරුව නවනගරය, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මොණරාගල ,අනුරාධපුරය යන ස්ථානයන්හි මධ්‍යස්ථාන 06 ක් පිහිටුවන අතර ඒ සඳහා රු.මි.76.56 ක් වැය කර ඇත.

පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය -යාපනය




දිවා සුරකුම් මධ්‍යස්ථානය - මඩකළපුව



කාන්තා රැකවරණ මධ්‍යස්ථානය -මුලතිව්



ළමා හා කාන්තා සංවර්ධන ඒකක -වාකරෙයි



## උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

| නිර්දේශ අංකය | ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් |
|---|---|
| 9.77 | සියලුම ළමා සොල්දාදුවන් පුනරුත්ථාපනය කර මුදාහැරීම.මේ සඳහා ප්‍රජා මූලික සංවිධාන වල යෝජනා ලබා ගැනීම් සිදුකල අතර වවුනියාවේ හා කිළිනොච්චියේ දැනුවත් කිරීම් වැඩ සටහන් දෙකක්(02) පවත්වා ඇත. |
| 9.87 | මේ යටතේ මුලින්ම අමාත්‍යාංශය යුද්ධය නිසා වැන්දඹු වූ කාන්තාවන්ගේ දත්ත එකරාශී කරන ලදි. ඒ අනුව පහත සඳහන් පරිදි දත්ත දැක්විය හැකිය.<br><br>යාපනය 2304<br>මන්නාරම 660<br>මුලතිව් 903<br>වවුනියාව 1316<br>කිළිනොච්චිය 102<br><br>ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් එකතු කරන ලද දත්ත දිවිනැගුම වැඩ සටහන යටතේ පහසුකම් සැපයීම සඳහා ලබා දෙන ලදි.<br><br>වැන්දඹුවන් සහ ගෘහමූලික කාන්තාවන් ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා වැඩ සටහන් සංවිධානය කිරීම.<br><br>කැගල්ල දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් සඳහාම ගෘහමූලික කාන්තාවන් 331 සඳහා අත්‍යාවශ්‍ය භාණ්ඩ හා උපකරන ලබා දෙන ලදි.<br><br>කාන්තාවන් 283 දෙනෙකු සඳහා චක්‍රීය ණය පහසුකම් ලබා දීම.<br><br>වතුකරයේ කාන්තාවන් 8904 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවත්වන ලදි.<br><br>කිළිනොච්චි සහ මුලතිව් හි කෙයාර් සංවිධානයේ සහයෝගය ඇතිව වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් උදෙසා විශේෂ සංවර්ධන වැඩ සටහන් ආරම්භ කිරීම.<br><br>මිනිස්බල ධාරිතා සංවර්ධනයේ දී GIZ සංවිධානයේ අනුග්‍රහය මත අමාත්‍යාංශය යටතේ වන ක්ෂේත්‍ර නිලධාරීන්ට සහ CBO නිලධාරීන්ට පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, කෙයාර් ජාත්‍යන්තර සංවිධානය අනුග්‍රහය යටතේ කිළිනොච්චි,මුලතිව් ළමා හා කාන්තා ඒකක සංවර්ධනයත්, දුෂ්කර මාර්ග සහිත ප්‍රදේශවල වනිතා සංවර්ධන නිලධාරීන් 22 හට යතුරුපැදි ලබා දෙන ලදි.<br><br>කාන්තාවන් දේශපාලන ක්ෂේත්‍රයේ බලගැන්වීම උදෙසා ඩිප්ලෝමා පාඨමාලාව දෙමළ මාධ්‍යයෙන් ක්‍රියාත්මක කිරීම. |

| නිර්දේශ අංකය | ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් |
| --- | --- |
| 9.88 | මේ සඳහා අන්තර් අමාත්‍යාංශ මට්ටමින් රැස්වීම් පවත්වා අදාළ නියෝජ්‍ය ආයතන සිවිල් සංවිධාන කණ්ඩායම් සමඟ පවතින සේවා හා විධි විධාන නියම කිරීම<br><br>අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධානයන්ගේ අනුග්‍රහයකත්වය යටතේ ඉලක්ක කණ්ඩායම් වෙත නව වැඩ සටහන් දියත් කිරීම.<br><br>පවත්වන ලද වැඩ සටහන් සම්බන්ධයෙන් තොරතුරු ඒකරාශී කර ගැනීම. |
| 9.89 | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් කාන්තාවන් 1950 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් 24 ක් පවත්වා ඇති අතර මඩකලපුව දිස්ත්‍රික්කයේ නිශ්පාදන අලෙවි පොලක් පවත්වන ලදි.<br><br>නවයොවුන් වියේ දරුදැරියන් 6467 ක් සඳහා ජීවන කුසලතා සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම.<br><br>CBO සාමාජික කාන්තාවන් 150 ක් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.<br><br>කාන්තා කාර්ය සංවිධාන 18 ක් ශක්තිමත් කිරීම.<br><br>වතුකරයේ කාන්තාවන් 1441 ක් උදෙසා සමාජ සවිබලගැන්වීම් සිදු කිරීම. |
| 9.90 | මේ සඳහා ජාතික කාන්තා කමිටුව හා ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි.<br><br>කාන්තාවන්ට එරෙහි සිදුන ප්‍රචණ්ඩත්වය හා මිනිස් වෙළඳාම වැළැක්වීම සම්බන්ධයෙන් ප්‍රජා නායකයන් සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් 15 ක් පැවැත්වීම.<br><br>කාන්තා අයිතීන් ආරක්ෂා කිරීම සහ ස්ත්‍රීපුරුෂ සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් 15 ක් පැවැත්වීම.<br><br>කාන්තා ප්‍රචණ්ඩත්වයට එරෙහිව ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩ සටහන් 03 ක් පැවැත්වීම.<br><br>බාලවයස්කාර දැරියන් ගැබ්ගැනීම වැළැක්වීම සඳහා පාසැල් දැරියන් දැනුවත් කිරීමේ වැඩ සටහන් 23 ක් පැවැත්වීම.<br><br>යාපනය,මුලතිව්,මුතුර්,කිළිනොච්චි,මන්නාරම් දිස්ත්‍රික්කවල කාන්තාවන්ට එරෙහි හිංසන වැලැක්වීම සඳහා වැඩ සටහන් 21 ක් පවත්වන ලදි.<br><br>ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතුවෙන් ඇති වන හිංසන අවම කිරීම උදෙසා උපදේශන පද්ධතිය ශක්තිමත් කිරීමට ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වැඩ මුළු දෙකක් පැවැත්වීම.<br>වාර්තාමය චිත්‍රපටි, අත්පත්‍රිකා යන මාධ්‍ය භාවිතා කරමින් බාලවයස්කාර විවාහ හා ලිංගික හා ස්ත්‍රි පුරුෂභාවය නිසා ඇතිවන හිංසන පිළිබඳව දැනුවත් කරන ලදි. |

| නිර්දේශ අංකය | ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් |
|---|---|
| 9.93 | මේ සඳහා දරුවන් 648 දෙනෙකුට සහනාධාර හා වෛද්‍ය ආධාර ලබා දීම.<br><br>අධ්‍යාපන අධාර වැඩ සටහන යටතේ දරුවන් 5634 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දීම.<br><br>ළමා නිවාස 12 ක සංවර්ධනය කිරීම හා නිලධාරීන් 391 ක් සඳහා ධාරිතා සංවර්ධනය කිරීම.<br><br>දරුවන් 1660 දෙනෙකුට කැපකරු මාපියක්‍රමයට යටතේ ප්‍රතිලාභ ලබා දී ඇත. |
| 9.94 | මේ යටතේ උතුර සහ නැගෙනහිර පළාත්වල මෙන්ම රත්නපුරය, කෑගල්ල, නුවරඑළිය,බදුල්ල දිස්ත්‍රික්කවල දරුවන් වෙනුවෙන් ළමා ආරක්ෂණය මෙන්ම මනෝ සමාජීය සහයෝගය ලබා දීම සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් 1324 ක් පවත්වා ඇත.<br><br>ළමා ආරක්ෂණ යාන්ත්‍රණය සංවර්ධනය හා ශක්තිමත් කිරීම සඳහා ළමා සමාජ වල දරුවන් දැනුවත් කිරීමේ වැඩ සටහන් 98 පවත්වා ඇත.<br><br>නව ළමා සමාජ 24 ක් පිහිටුවීම.<br><br>ළමා ආරක්ෂණ ආදර්ශ ගම්මාන 9 ක් පිහිටුවිම.<br><br>ළමා ශ්‍රමය වැළැක්වීමේ ජාතික වැඩ සටහන යටතේ වතුකරයේ ප්‍රජාව හා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ පවත්වන ලදි.<br><br>ළමා අපචාර වැළැක්විම අවම කිරීම සඳහා වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩ සටහන් 264 පවත්වන ලදි. |
| 9.95 | වව්නියාව දකුණ,නල්ලූර්,වඩමාරච්චි උතුර,මන්නාරම , මුලතිව් සහ කරෛයිනගර් හි මුල් ළමාවිය ආරක්ෂණය සඳහා ආදර්ශ ගම්මාන 05 ක් පිහිටුවීම.<br><br>මුලතිව් දිස්ත්‍රික්කයේ මැරිටයිම්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල පෙරපාසල් 02 ක සඳහා ගොඩනැගිලි ඉදිකිරීම.<br><br>අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ දිවා සුරකුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.<br><br>උතුරු නැගෙනහිර පළාත්වල සහ වතුකරයේ දරුවන් 108743 දෙනෙකු සඳහා කිරිවීදුරුව වැඩ සටහන යටතේ දියර කිරි ලබා දෙන ලදි.<br><br>වතුකරයේ හා උතුර, නැගෙනහිර පළාත්වල පෙර පාසල් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැලසීම.<br><br>නුවරඑළිය,කෑගල්ල, මාතලේ,බදුල්ල, නුවර,රත්නපුර,ගාල්ල යන දිස්ත්‍රික්ක වල හා උතුර ,නැගෙනහිර පළාත්වල පෙරපාසැල් සඳහා ළමා උයන් 121 ක් වැඩි දියුණු කිරීම. |

| | |
|---|---|
| | දෙමාපියන්, භාරකරුවන්, මුල් ළමාවිය සංවර්ධනය සඳහා සේවා සපයන්නන්, මහජනතාව උදෙසා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහන් 251 ක් පැවැත්වීම.<br><br>ආධාර අවශ්‍ය දරුවන් 1475 ක් සඳහා පාසැල්උපකරණ සහ අනෙකුත් මූල්‍ය ආධාර සැපයීම. (රත්නපුර,හම්බන්තොට,කැගල්ල, නුවරඑළිය,මාතර,නුවර,උතුරු පළාත හා නැගෙනහිර පළාත)<br><br>වතුකරයේ ළමා පුස්තකාල 11 ක් පිහිටුවීම.<br><br>පාසල් ආරක්ෂණ කමිටු 1845 ක් පිහිටුවීම සහ ශක්තිමත් කිරීම. (රත්නපුරය,කැගල්ල,නුවරඑළිය,බදුල්ල දිස්ත්‍රික්ක වල හා උතුර හා නැගෙනහිර පළාත්වල )<br><br>උතුරු නැගෙනහිර පළාත්වල හා වතු අංශයේ මුල් ළමාවිය සංවර්ධන කමිටු ග්‍රාමීය මට්ටමින්, ප්‍රාදේශී මට්ටමින්, දිස්ත්‍රික්ක මට්ටමින් සහ පළාත් මට්ටමින් පිහිටුවීම හා ශක්තිමත් කිරීම.<br><br>2014.03.14 දින වව්නියාව දකුණ වෙහෙරතැන්නේහි පියවර පෙර පාසල විවෘත කිරීම.<br><br>මන්නාරම සහ මඩකළපු දිස්ත්‍රික්කයන්හි ළමා මිතුරු පරිශ්‍ර 02 ක් පිහිටුවීම. |
| | |





# 2014.12.31 දිනට කාර්යය මණ්ඩලය

| අනු අංකය | තනතුර | සේවය | ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| **01.** | ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | ( විශේෂ) | 01 | 01 |
| **02.** | අතිරේක ලේකම් (පාලන හා මුදල්) | ශ්‍රී.ලං.ප.සේ | (විශේෂ) | 01 | 01 |
| **03.** | අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ | (විශේෂ) | 01 | 01 |
| **04.** | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | 1 | 01 | 01 |
| **05.** | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | 1 | 01 | 01 |
| **06.** | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | 1 | 01 | 01 |
| **07.** | අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ | 1 | 01 | 01 |
| **08.** | අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය) | ශ්‍රී.ලං.ප.සේ | 1 | 01 | 01 |
| **09.** | අධ්‍යක්ෂ (ළමා ලේකම්) | ශ්‍රී.ලං.ප.සේ | 1 | 01 | 01 |
| **10.** | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ | 1 | 01 | 01 |
| **11.** | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | 11/111 | 02 | 01 |
| **12.** | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | 11/111 | 05 | 05 |
| **13.** | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ | 11/111 | 02 | 04 |
| **14.** | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ | දෙපාර්තමේන්තු | 11/111 | 02 | 0 |
| **15.** | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | 11/111 | 01 | 01 |
| **16.** | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ITC) | ශ්‍රී.ලං.තො.තා.සේ. | 11/111 | 01 | 0 |
| **17.** | නීති නිලධාරි | දෙපාර්තමේන්තු | 11/111 | 03 | 01 |
| | **තෘතීක මට්ටම** | | | | |
| **18.** | පරිපාලන නිලධාරි | රාජ්‍යකළමනාකරණ සහකාර සේවය (අධිපන්තිය) | MN-07 | 01 | 01 |
| **19.** | පර්යේෂණ නිලධාරි | දෙපාර්තමේන්තු | MN-06 | 01 | 0 |
| **20.** | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | MN-06 | 02 | 1 |
| **21.** | උපදේශන නිලධාරී | දෙපාර්තමේන්තු | MN-05 | 13 | 10 |
| | **ද්වීතීක මට්ටම** | | | | |
| **22.** | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | | 01 | 01 |
| **23.** | සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා | MN-04 | 24 | 24 |
| **24.** | මුල් ළමාවිය සංවර්ධන සහකාර | දෙපාර්තමේන්තු | MN-04 | 175 | 94 |
| **25.** | වනිතා සංවර්ධන නිලධාරි | දෙපාර්තමේන්තු | MN-04 | 335 | 284 |
| **26.** | අයවැය සහකාර | ආශ්‍රිත සේවා | MN-04 | 01 | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **27.** | සංවර්ධන නිලධාරි | සංවර්ධන නිලධාරි සේවය | MN-04 | 709 | 517 |
| **28.** | පුස්තකාලයාධිපති | පුස්තකාලයාධිපති සේවය | MN-03 | 01 | 0 |
| **29.** | පුස්තකාල සහකාර | දෙපාර්තමේන්තු | MN-01 | 01 | 01 |
| **30.** | රාජ්‍ය කළමනාකරණ සහකාර | රාජ්‍ය කළ.සහකාර සේවය (1,11,111) | MN-02 | 40 | 30 |
| **31.** | නිශ්චල ඡායාරූප ශිල්පි | දෙපාර්තමේන්තු | MT-01 | 01 | 01 |
| **32.** | වීඩියෝ කැමරා ක්‍රියාකරු (තාවකාලික) | දෙපාර්තමේන්තු | MT-01 | 01 | 01 |
| **33.** | තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන ස. | තො.තා.හා ස.ස | MT-01 | 03 | 01 |
| **34.** | පිළිගැනීමේ නිලධාරි | දෙපාර්තමේන්තු | MN-01 | 01 | 01 |
| **35.** | සහන සොයුරි | දෙපාර්තමේන්තු | MN-01 | 134 | 125 |
| **ප්‍රාථමික මට්ටම** | | | | | |
| **36.** | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | PL-02 | 30 | 30 |
| **37.** | කාර්යාල කාර්ය සහයක | කාර්යාල සේවක සේවය | PL-01 | 26 | 26 |
| **38.** | නේවාසිකාගාර කම්කරු | දෙපාර්තමේන්තු | PL-01 | 01 | 01 |
| **39.** | උපදේශන සේවා කම්කරු | දෙපාර්තමේන්තු | PL-01 | 11 | 11 |

# ආංශීය කාර්යය සාධනය

## පාලන අංශය

### ප්‍රධාන කාර්යභාරය

01. අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සම්බන්ධ ආයතනික කටයුතු, සම්බන්ධීකරණය හා විනය කාර්යයන් පවත්වාගෙන යාම.
02. අමාත්‍යාංශයීය අනුමත තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම.
03. අමාත්‍යාංශයේ ව්‍යාපෘති හා කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය නව තනතුරු මු.රෙ.71 ට අනුව ඇති කිරීමට කටයුතු කිරීම.
04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 ට අනුව දෙපාර්තමේන්තු තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි / උසස් කිරීමේ පටිපාටි සංශෝධනයන් සකස් කර අනුමත කර ගැනීම හා උසස් කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

05. විවිධ අංශ සමඟ සම්බන්ධිකරණය වෙමින් පාර්ලිමේන්තු ප්‍රශ්ණ වලට පිළිතුරු සැපයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සකස්කිරීම, හා මෙම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ කටයුතු.
06. අමාත්‍ය කාර්යාලය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලයට අයත් කාර්යය මණ්ඩලයේ ආයතනික කටයුතු.
07. තැපැල අංශ වලට බෙදා හැරීම හා පිටතට යැවෙන ලිපි තැපැල් කිරීම.
08. සැපයුම් හා සේවා පවත්වාගෙන යාම (ආරක්ෂක, පිරිසිදු කිරීම්, විදුලි බිල්පත් , ජලබිල්පත්, පුවත්පත්, ප්‍රවාහන පහසුකම්, දුරකථන , දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර , දුම්රිය ගමන් බලපත්‍ර ,සංග්‍රහ කටයුතු, වාහන රක්ෂණය )
09. වාහන සංචිතය පවත්වාගෙන යාම, වාහන ගර්හිත කිරිම , අලුත්වැඩියා කිරීම හා අලුත් වාහන මිලදී ගැනීම.
10. ගොඩනැගිලි හා උපකරන නඩත්තු කටයුතු.
11. අත්තිකාරම් ණය, උත්සව අත්තිකාරම් , විශේෂ අත්තිකාරම් , ආපදා ණය , දේපල ණය හා අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ ආයතනික කටයුතු .
12. බියගම කාන්තා සෙවන නේවාසිකාගාරය පවත්වාගෙන යාම.
13. අමාත්‍යාංශයීය කාර්යය මණ්ඩලය පුහුණු කිරීම්.

### i. කාර්ය මණ්ඩල කටයුතු

අමාත්‍යාංශය යටතේ සේවයේ යෙදි සිටින කාර්ය මණ්ඩලය 1261 කි. මෙම කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ක්‍රමවත්ව පවත්වගෙනයාම හා යාවත්කාලීන කිරීම, එදිනෙදා නිවාඩු සම්බන්ධ රාජකාරී, වැටුප් වර්ධක ලබාදීම, ස්ථාන මාරුවීම්, විශ්‍රාම ගැන්වීම් ආදි පරිපාලන කටයුතු නිසි පරිදි සිදු කර ඇත. එසේම කාර්ය අමාත්‍ය කාර්ය මණ්ඩලය ඇතුළුව නිලධාරින්ගේ දුරකථන බිල්පත් නිරවුල් කිරීම සම්බන්ධ කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරයි.

කාර්ය මණ්ඩලයේ දැනුම , තාක්ෂණික හැකියාව සහ භාෂා ප්‍රවීණතාවය ඉහළ ගැන්වීම අරමුණු කරගෙන දේශිය හා විදේශිය පුහුණු පාඨමාලා සඳහා නිලධාරින් අඛණ්ඩව යොමු කර ඇත. මේ යටතේ 2014 වර්ෂයේදී පුහුණු පාඨමාලා/වැඩමුළු සඳහා පහත සඳහන් පරිදි කාර්යය මණ්ඩලය යොමු කරන ලදි.

### ii. නඩත්තු කටයුතු

අමාත්‍යාංශයට අයත් සියලුම අංශවල ඇති කාර්යාල උපකරන අළුත්වැඩියා කිරීම් හා අමාත්‍යාංශය සතුව පවතින සියලුම වාහන නඩත්තු සම්බන්ධයෙන් පාලන අංශය කටයුතු කර ඇත.

### iii. අනුබද්ධ ආයතනවල කටයුතු

අමාත්‍ය යටතේ ක්‍රිත්මක වන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යන ආයතනවල පරිපාලන කටයුතු සම්බන්ධීකරණය හා මඟපෙන්වීම සම්බන්ධයෙන් පාලන අංශය ක්‍රියා කර ඇත. උක්ත ආයතන වල රා.ප.ච.6/2006 අනුව බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය, කාර්ය මණ්ඩලයේ තනතුරු ඇති කිරීම, පත් කිරීම, උසස් කිරීම, කාර්ය මණ්ඩලයේ සේවා ගැටළු පිළිබඳව අමාත්‍යාංශයට ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධ කටයුතු සිදු කර තිබේ. එසේම මෙම ආයතනවල නිලධාරින්ගේ විදේශ සංචාර, ශිෂ්‍යත්ව, පුහුණු පාඨමාලා ආදිය සඳහා අනුමැතිය ලබා දීම ද අදාළ පරිදි නිවාඩු ලබාදිම ද සිදුකර ඇත.

### V.බියගම කාන්තා සෙවණ නේවාසිකාගාරය

බියගම ආයෝජන කලාපයේ කාර්මාන්ත ශාලාවන්හි රැකියාවල නියුතු කාන්තාවන්ට නේවාසික පහසුකම් සපයන මෙම"කාන්තා සෙවණ" නේවාසිකාගාරයේ භාවිතයට නොගන්නා භාණ්ඩ අපහරණය කර අළුත්වැඩියා කිරිම මෙම වර්ෂයේදී සිදු කරන ලදි. ඒ අනුව කාන්තාවන් 250 ක් පමණ පිරිසක් සුරක්ෂිතව නේවාසික පහසුකම් ලබා දෙනු ඇත.

### Vi.ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු

කාර්යක්ෂම මහජන සේවයක් හා ප්‍රියමනාප කාර්යාල පරිශ්‍රයක් ඇති කිරීම සඳහා අමාත්‍යාංශය ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කරන ලදි. එසේම ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් පවත්වනු ලබන ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියට ඉදිරිපත් වු අතර ඉන් ප්‍රශංසා සහතිකයක් හිමිකරගන්නා ලදි.

## ගිණුම් අංශය

### ප්‍රධාන කාර්යයන්

01. මාසික වැටුප් ගෙවීම්.
02. බැංකු ණය සඳහා අවශ්‍ය වැටුප් සම්බන්ධ ලේඛන නිකුත් කිරීම.
03. අතිකාල, ගමන් වියදම්, අත්තිකාරම් හා වියදම් ප්‍රතිපූර්ණය ඇතුළු සියලුම ගෙවීම් කටයුතු.
04. අත්තිකාරම් බී ගිණුම පොදු තැන්පත් ගිණුම පවත්වාගෙන යාම.
05. ආපදාණය, උත්සව අත්තිකාරම්,ඇතුළු සියලුම දෙපාර්තමේන්තු ණය ගෙවීම.
06. ගබඩාව පවත්වාගෙන යාම.
07. භාණ්ඩ සමීක්ෂණ කටයුතු.
08. ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම.
09. පරිගණක වත්කම් ලේඛනය පවත්වාගෙන යාම.
10. වැය ශීර්ෂ 120 යටතේ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම පිළියෙල කිරීම.
11. ප්‍රසම්පාදන කටයුතු.

ශීර්ෂය 120- ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ 2014 වර්ෂය සඳහා වු 2014 .12.01

දිනැති අංක 239/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් ඩීජීඑස්ඒ 1 ආකෘතියේ සිට 10 ආකෘතියද, සටහන (i) සිට සටහන (iv) (අ) හා (ආ) දක්වා වූ තොරතුරු සාරාංශයකින් සමන්විතව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්ට ,2014 අංක 47 දරන විසර්ජන (සංශෝධිත ) පනතින් සංශෝධනය කරන ලද 2013 අංක 36 දරන විසර්ජන පනත හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට ,2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 2014 ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුවට,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී

ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඇතුලත් රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව සකස්කර නියමිත දිනට ඉදිරිපත් කර ඇත.

## 2014 වර්ෂයේ මුල්‍ය ප්‍රගතිය

| වැඩ සටහන් අංකය | වැඩ සටහනේ නම | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් | ශුද්ධ වෙන් කිරීම් | මුළු වියදම |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| | පුනරාවර්තන | | | | |
| 1 | මෙහෙයුම්ක්‍රියාකාරකම් | 716,365,000 | -410,000 | 715,955,000 | 711,898,232 |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 577,530,000 | 410,000 | 577,940,000 | 460,647,732 |
| | උප එකතුව (පුනරාවර්තන) | 1,293,895,000 | 0 | 1,293,895,000 | 1,172,545,964 |
| | මූලධන | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 156,700,000 | - | 156,700,000 | 128,306,195 |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 583,750,000 | - | 583,750,000 | 539,528,784 |
| | උප එකතුව (මූලධන) | 740,450,000 | - | 740,450,000 | 667,834,979 |
| | මුළු එකතුව | 2,034,345,000 | 0 | 2,034,345,000 | 1,840,380,943 |

## වියදම් මුල්‍යකරණය

| | | වැඩ සටහන 1 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය |
| | | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 835,655,000 | 826,376,360 | 835,655,000 | 826,376,360 | 99 |
| 13 | විදේශ ආධාර-ප්‍රධාන | 37,000,000 | 13,828,067 | 37,000,000 | 13,828,067 | 37 |
| | එකතුව | 872,655,000 | 840,204,427 | 872,655,000 | 840,204,427 | |

| | | වැඩ සටහන 2 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය |
| | | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 1,074,115,000 | 949,104,055 | 1,074,115,000 | 949,104,055 | 88 |
| 13 | විදේශ ආධාර-ප්‍රධාන | 93,075,000 | 52,278,076 | | 52,278,076 | 56 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | 93,075,000 | | |
| | එකතුව | 1,167,190,000 | 1,001,382,131 | 1,167,190,000 | 1,001,382,131 | |

## රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

| 2014.01.01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුළ හර කිරීම් | වර්ෂය තුළ බැර කිරීම් | 2014.112.31 දිනට ශේෂය |
|---|---|---|---|
| 53,480,611.49 | 16,690,598.00 | 15,585,893.83 | 54,585,315.66 |

# අභ්‍යන්තර විගණන අංශය

## ප්‍රධාන කාර්යයන්

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල මුදල් හා ආයතන කටයුතු විගණනය හා වාර්තා කිරීම.
- වැරදි හා වංචා වැලැක්වීම සඳහා අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වන පාලන ක්‍රම, සාර්ථක දැයි සොයාබැලීම හා ඒ පිළිබඳ නිරීක්ෂණ හා යෝජනා ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශයේ ගිණුම් හා වෙනත් වාර්තාවල විශ්වාසනීයත්වය විනිශ්චය කිරීම හා අමාත්‍යාංශයේ වත්කම් සියලුම ආකාරයේ අලාභහානි වලින් උපරිම වශයෙන් ආරක්ෂා කර ඇත්දැයි යන්න සොයා බැලීම හා වාර්තා කිරීම.
- අමාත්‍යාංශයේ යටත් අංශවල පහත සඳහන් කටයුතු සම්බන්ධව ප්‍රගති සමාලෝචනය කිරීම සඳහා මාස තුනකට (03) වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.
    - වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම හා දුර්වල කාර්යසාධනයන් මගහරවාගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ඉදිරිපත් කිරීම.
    - විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන විගණන විමසුම්/විගණන වාර්තා සඳහා පිළිතුරු සැපයීම.
    - වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳ ඉදිරිපත් කිරීම්.
    - වාර්ෂික වාර්තා/ කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
    - වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම පිළිබඳ විගණනය
    - සංවර්ධන හා අභ්‍යන්තර පරිපාලන කටයුතු
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු සිදුවීම ප්‍රමාදවීමට තුඩු දී ඇති ගැටළු විගණනය කිරීම හා වාර්තා කිරීම.

## 2014 වර්ෂයේ සිදු කරන අභ්‍යන්තර විගණන විමසුම්

| දිනය | විමසුම | අංශය |
|---|---|---|
| 2014.01.24 | අධ්‍යාපන උපකරන ලබා දීම | ළමා ලේකම් කාර්යාලය |
| 2014.02.25 | චක්‍රීය ණය සහ වනිතා ශක්ති පදනම් අරමුදල් විගණනය | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය |
| | ජා ඇල කාන්තා බල මණ්ඩල විගණනය | |
| 2014.02.28 | දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශන කුටි නිර්මාණය | ගිණුම් අංශය |
| 2014.03.03 | පාදුක්ක වනිතා ශක්ති පදනම | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය |
| දිනය | විමසුම | අංශය |
| 2014.03.12 | ලී බඩු උපකරණ පිළිබඳ පරික්ෂාව -2013 | ගිණුම් අංශය |
| 2014.05.20 | 2012/2013 වර්ෂවල මිලදී ගත් පරිගණක උපාංග සහ කාර්යාල උපකරණ ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ පරික්ෂාව | ආයතන අංශය |
| 2014.05.28 | 2012/2013 වර්ෂවල මිලදි ගත් පරිගණක උපාංග සහ කාර්යාල උපකරණ ලේඛනගත කිරීම සහ ගබඩා ක්‍රියාවලිය පිළිබඳ පරික්ෂාව | |
| | ලී බඩු උපකරණ මිලදී ගැනීම පිළිබඳ පරික්ෂාව | |
| | අමාත්‍යාංශයේ මිලදී ගැනීමේ සහ ගබඩා කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විගණන පරික්ෂණය | ගිණුම් අංශය |
| 2014.05.29 | එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතිය -2013 | සංවර්ධන අංශය |
| | වනිතා ශක්ති ගිණුම් පරික්ෂාව -ඉබ්බාගමුව කලාපය | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය |
| 2014.06.05 | වැලිගේපොල ප්‍රා.ලේ.කො.ක්ෂේත්‍ර පරික්ෂාව | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය |
| 2014.06.20 | චක්‍රීය ණය වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම. | ගිණුම් අංශය |
| 2014.06.24 | චක්‍රීය ණය වැඩ සටහන - වැලිගේපොල ප්‍රා.ලේ.කො | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය |
| | වැලිගේපොල ප්‍රා.ලේ.කො.ක්ෂේත්‍ර පරික්ෂාව | |
| | මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ආදර්ශ ගම්මාන පිහිටුවීම | ළමා ලේකම් කාර්යාලය |
| 2014.08.22 | සියඹලාණ්ඩුව ප්‍රා.ලේ.කො.වනිතා ශක්ති පදනම් පරික්ෂා කිරීම. | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය |
| 2014.08.26 | කන්තලේ ප්‍රා.ලේ.කො.වනිතා ශක්ති පදනම් ගිණුම් පරික්ෂා කිරීම. | |
| 2014.09.01 | අභ්‍යන්තර විගණන පරික්ෂාව බැංකු සැසඳුම් ප්‍රකාශන | ගිණුම් අංශය |
| 2014.10.15 | ගම්පහ ප්‍රා.ලේ.කො.වනිතා ශක්ති පදනම සහ චක්‍රීය ණය පරික්ෂා කිරීම | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය |
| 2014.10.27 | ගම්පහ ප්‍රා.ලේ.කො.වැලිවේරිය වනිතා ශක්ති පදනමේ ගිණුම් පරීක්ෂා කිරීම. | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය |
| 2014.10.28 | අග්‍රිම අත්තිකාරම් නොපියවීම | ගිණුම් අංශය |
| 2014.10.30 | පාදුක්ක ප්‍රා.ලේ.කො.වනිතා ශක්ති ලදනම සම්බන්ධව ඉදිරිපත් කළ වාර්තාවේ ප්‍රගතිය වාර්තා කිරීම. | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය |
| | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල පෙර පාසැල් දරුවන් සඳහා නැවුම් කිරි වීදුරුව ලබා දීමේ වැඩසටහන -2014 | ළමා ලේකම් කාර්යාලය |
| 2014.11.13 | වනිතා ශක්ති පදනම වල වර්තාමාන තත්වය පරික්ෂා කිරීම | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය |

| | | |
|---|---|---|
| 2014.12.09 | රු.මිලියන 700 ව්‍යාපෘතිය - කොළඹ දිස්ත්‍රික්කය | පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව |
| 2014.12.29 | ළමා අපයෝජන සහ කාන්තා හිංසනය වැලැක්වීමේ රු.මි.700 වැඩ සටහන-අනුරාධපුර දිස්ත්‍රික්කය | |
| 2014.12.31 | අනුරාධපුර දිස්ත්‍රික්කය ප්‍රා.ලේ.කො.වනිතා ශක්ති පදනම් පරික්ෂා කිරීම | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය |
| | අනුරාධපුර දිස්ත්‍රික්කය ප්‍රා.ලේ.කො.වක්‍රීය ණය පරික්ෂාව | |

## සැලසුම් අංශය

### ප්‍රධාන කාර්යභාරය

01. අමාත්‍යාංශයේ සියලු අංශ සහ දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කර ගනිමින් ඉදිරි සැලසුම්සකස් කිරීම.
02. අමාත්‍යාංශයේ සියලු අංශ සහ දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කර ප්‍රගති වාර්තා සකස් කිරීම.
03. සැලසුම් අංශයට අදාල මාධ්‍ය කටයුතු මාධ්‍ය අංශය හා එක්ව සිදු කිරීම, තොරතුරු බෙදා හැරීම හා සම්බන්ධීකරණය.
04. රාජ්‍ය නොවන සංවිධාන (NGO and INGO's) සමඟ පවත්වන වැඩසටහන් සම්බන්ධීකරණය හා ප්‍රගති වාර්තාකරණය.
05. අමාත්‍යාංශය නියෝජනය කරමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් හා දැනුවත් කිරීමේ වැඩසටහන් වශයෙන් පවත්වන විවිධ උත්සව අවස්ථා සංවිධානය හා සාර්ථකව පැවැත්වීම.
06. විවිධ සමාජ සත්කාරක සේවාවන් සඳහා දායකත්වය ලබා දීම.
07. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් මෙහෙයුම් හා පසු විපරම් කිරීම (ජාතික/දිස්ත්‍රික්/හා ප්‍රාදේශීය මට්ටමේ කාන්තා හා ළමා සංවර්ධන වැඩසටහන්.
08. සැලසුම් අංශයට අදාල මූලික විෂයානුබද්ධ තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම.
09. පර්යේෂණ ආයතන වෙත ප්‍රගති වාර්තා හා සැලසුම් ලබා දීම.
10. අමාත්‍යාංශයේ අවශ්‍යතාවය පරිදි විවිධ විශේෂ විෂය කරුණු යටතේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සංවිධානය.

## 2014 වර්ෂයේ ක්‍රියාකාරකම්

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| 01. සැලසුම් සකස් කිරීම. | |
| | සැලසුම් 01 |
| *වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | සැලසුම් 01 |
| *දැයට කිරුළ ජාතික සංවර්ධන සැලැස්ම සකස් කිරීම. | සැලසුම් 01 |
| * LLRC සැලැස්ම සකස් කිරීම | |
| * ජාතික පෝෂණ ක්‍රියාකාරී සැලැස්ම - ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම. | සැලසුම් 01 |
| *ළමා අපයෝජන හා කාන්තා හිංසන | සැලසුම් 01 |

| | |
|---|---|
| වැළැක්වීම සඳහා විශේෂ ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම.<br>*දිස්ත්‍රික් සැලසුම් සකස් කිරීම. | සැලසුම් 01 |
| 02. මෙහෙයුම් හා ප්‍රගති සමාලෝචනය<br>*මාසික ප්‍රගති වාර්තා සැකසීම<br>* කාර්තු ප්‍රගති වාර්තා සකස් කිරීම<br>*LLRC ප්‍රගති වාර්තා සැකසීම<br>*දිස්ත්‍රික් ප්‍රගතිවාර්තා සැකසීම<br>*ප්‍රගති සමාලෝචන රැස්වීම් (ජාතික මට්ටම)<br>*වාර්ෂික ප්‍රගති වාර්තා | ප්‍රගති වාර්ථා මෘදු පිටපත් 12<br>ප්‍රගති වාර්තා 04<br>ප්‍රගති වාර්තා 12<br>ප්‍රගති වාර්තා 04<br>රැස්වීම් 04<br>ප්‍රගතිවාර්තා පොත් හා සී.ඩී පට සැකසීම |
| 03. වෙබ් අඩවිය පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.<br>04. වැඩ සටහන් ඇගයීම | ඇගයීම් වාර්තා 04 |
| 05. විශේෂ වැඩ සටහන්<br>විවිධ ක්ෂේත්‍ර යටතේ පුහුණු වැඩ සටහන් ජාතික හා ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් සඳහා පැවැත්වීම.<br>(ආපදා කළමනාකරණය,ප්‍රථමාධාර පුහුණුව ,සෞඛ්‍ය කඳවුරු,සෞඛ්‍ය හා පෝෂණ,ළමා හා කාන්තා ක්ෂේත්‍ර නිලධාරීන්ට ඔටිසම් පිළිබඳ දැනුවත් කිරීම,මුල් ළමාවිය දරුවන්ගේ පෝෂණය පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන් නේවාසික පුහුණු වැඩ සටහන ආදිය) | වැඩ සටහන් 04 |
| 06. විවිධ ප්‍රකාශණ එළිදැක්වීම<br>දත්ත හා තොරතුරු ප්‍රකාශය | වැඩ සටහන් 09 |





# සංවර්ධන අංශය

## ප්‍රධාන කාර්යභාරය

ළමයින්ගේ හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ සංවර්ධනය තහවුරු කෙරෙන සංවේදි සමාජයක් බිහිකිරිමේ අරමුණින් අමාත්‍යාංශයේ සියලු අංශ හා ආයතන මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩ සටහන්වලට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, එම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, එක්සත් ජාතීන්ගේ අනුග්‍රාහක ආයතන හා රාජ්‍ය නොවන සංවිධානවලට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

මෙම වර්ෂයේ දී දිරිය කාන්තා වැඩ සටහන යටතේ රු.33,000,000 අයවැය ඇස්තමේන්තු වෙන් වූ අතර වසර අවසානයේ දී මුල්‍ය ප්‍රගතිය රු.32,436,096 විය.ඒ අනුව 98% මුල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

| වැඩ සටහන | මුල්‍ය ඉලක්කය රු. | මුල්‍ය ප්‍රගතිය රු. | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| දිරිය කාන්තා වැඩ සටහන (120-01-02-2502(4) | 33,000,000 | 32,436,096 | වැන්දඹු හා ගෘහ මූලික පවුල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ කෑගල්ල, පුත්තලම,කුරුණෑගල යන දිස්ත්‍රිකකයන්හි අඩු ආදායම්ලාභී වැන්දඹු කාන්තා පවුල් වල දරුවන් 1452 ක් සඳහා පාසල් උපකරණලබාදීමත්, වෙන්නප්පුව, නාත්තණ්ඩිය, දංකොටුව,මහවැව,මාදම්පේ,ආරච්චිකට්ටුව,හලාවත,මුන්දලම,පල්ලම,මහකුඹුක්කඩවල,කල්පිටිය, කරුවලගස්වැව,පුත්තලම,වනාතවිල්ලුව,නවගත්තේගම,ආණමඩුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් 301 දෙනෙකු සඳහා ස්වයංරැකියා ආධාර සැපයීමත් සිදු කරන ලදි.වැය වු මුදල රු.මිලියන 9.3009 වේ. |
| | | | ජාත්‍යන්තර කාන්තා දිනයේ ජාතික උත්සවය "ඇගේ ශක්තිය දැයේ ශක්තියයි"යන තේමාව කොළඹ ආනන්ද විද්‍යාලීය කුලරත්න ශාලාවේදී සැමරූ අතර ඊට සමගාමීව ප්‍රාදේශීය උත්සව සංවිධානය කර පවත්වන ලදි. මේ සඳහා රු.මි.4.89 ක් වැය කරන ලදි. |
| | | | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ ළමා හා කාන්තා සංවර්ධන ඒකක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 29 ක පිහිටුවීමත්, ළමා හා කාන්තා කේන්ද්‍ර නිලධාරීන් සම්බන්ධීකරණයෙන් අමාත්‍යාංශ 38 ක සේවා ස්ථානයන් හි සිදුවන හිංසනයන් අවම කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමත්,මෙම වසරේ සිදු කරන ලදි.මේ සඳහා රු.මි.11.950 වැය කර ඇත. |
| | | | කාන්තාවන් සම්බන්ධයෙන් විධිමත් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශය තුළ තොරතුරු තාක්ෂණ ඒකකයේ සංවර්ධන කටයුතු කිරීමත්,ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩ සටහන් අධීක්ෂණ කිරීමත් අමාත්‍යාංශයේ මෙහෙවර පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය හා ප්‍රචාරණ කටයුතුත් සිදු කිරීම සඳහා රු.මි.6.3003 වැය කර ඇත. |

# ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

## දැක්ම

ශ්‍රී ලාංකීය ජනසමාජය උදෙසා ,තීක්ෂණ ,සංවේදි හා විශ්වාසයෙන් යුතු කාන්තා පරපුරක් නිර්මාණය කරන ජාතික ආයතනය බවට පත් කිරීම.

## මෙහෙවර

සිය බුද්ධියද ශක්තියද උපරිම හා යහපත් ලෙස භාවිතා කරමින් ස්වශක්තියෙන් අභියෝගයන්ට මුහුණ දෙන ශ්‍රී ලාංකීය කාන්තා පරපුරක් සඳහා උචිත පරිසරයක් නිර්මාණය කිරීමට විධිමත් සංවිධාන රාමුවක් ඔස්සේ සැලසුම් සහගත වූ දැනුවත්බව ලබා දෙමින් සිදු කෙරෙන සමාජීය හා ආර්ථික බල ගැන්වීම මඟින් රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව කාන්තා අභිවෘද්ධිය උදෙසා ක්‍රියාත්මක වන ජාතික යාන්ත්‍රණය බවට පත්වීම.

## අරමුණු

01. ආර්ථික ,සමාජයීය ,දේශපාලනික හා සංස්කෘතික ආදී ක්ෂේත්‍රයන් තුළ ශ්‍රී ලාංකීය කාන්තාවන්ට සමාන අයිතිවාසිකම් භුක්ති විඳීමට අවස්ථාව සලසා දීම.
02. කාන්තාවන් වූ නිසාම නොයෙකුත් ක්ෂේත්‍ර තුළ දැනට අත්විඳින බාධා ඉවත් කිරීම සඳහා ඔවුන් සවිබල ගැන්වීම.
03. කාන්තාවන්ට සම අයිතිවාසිකම් හා සම අවස්ථා තහවුරු විය යුතු අංශ හඳුනා ගැනීම,ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමට සහය දීම සහ ඒ සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

## ප්‍රධාන කාර්යභාරය

01. ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික වශයෙන්ද ,සමාජීය වශයෙන්ද බල ගැන්වීම සඳහා සුදුසු වැඩ සටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම , සැලසුම් කිරීම,ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම.
02. සියලුම වයස් පරාසවල කාන්තාවන්ගේ සුවිශේෂිතා හඳුනාගෙන ඔවුන් උචිත පරිදි රටේ සමස්ත සංවර්ධනයේ කොටස් කරුවන් කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම.
03. කාන්තාවන් වීම නිසාම ඔවුන් මුහුණ දෙන සමාජීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
04. සමාජයේ විශේෂ හේතූන් නිසා විවිධ පීඩාවන්ට මුහුණ දෙන කාන්තාවන් අරභයා විශේෂ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
05. සමස්ත කාන්තා පරපුරේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ තලයකට නංවාලීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
06. කාන්තාවන්ට එකම සංවිධානය තුළ ක්‍රියාත්මක වීම අනාකූල වීම සඳහා ප්‍රජා මූල මට්ටමේ සිට ජාතික තලය දක්වා කාන්තාවන් එකම ජාලයක් තුළ සංවිධාන ගත කිරීම.

## සමුච්ත මුල්‍ය ප්‍රගතියට අනුව භෞතික ප්‍රගතිය

2014 වර්ෂයේ දී රු.30,000,000 අය වැය ඇස්තමේන්තු වෙන් වූ අතර මුළු වියදම රු.29,859,624 ක් විය .ඒ අනුව මුළු වෙන් කිරීම් වලින් 99% ශුද්ධ මුල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගැනීමට හැකි වි ඇත.

### කාන්තා සවිය වැඩ සටහන (120-02-03-6-2502)-11

| ක්‍රියාකාරකම් | මුල්‍ය ඉලක්ක ය රු.මි | මුල්‍ය ප්‍රගතිය රු.මි | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම | 17.300 | 16.6026 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 33 ක අඩු ආදායම්ලාභී වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් 530 හඳුනාගනිමින් ඔවුන්ගේ මාසික ආදායම ඉහළ නැංවීම සඳහා ස්වංරැකියා ආරම්භ කිරීමට ආධාර ලබා දීම හා පුහුණු කිරීම.මේ සඳහා රු.මි.7.7445 වැය කර ඇත. |
| | | | සතත්ව පාලනය තුලින් තම පවුලේ පෝෂණයත්,අතිරික්ත නිෂ්පාදන හා අතුරුනිෂ්පාදන වෙළඳපොලට එක් කරමින් අතිරේක ආදායම් වර්ධනයත් අරමුණු කරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10 ක ප්‍රතිලාභීන් 157 දෙනෙකු සඳහා මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි.වැය කරන ලද මුදල රු.මි.1.451 |
| | | | කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් ආදායම් උත්පාදන වලට යොමු කරවීමත්,චක්‍රිය ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීම, කළමනාකරණ ව්‍යවසාය හා ගිණුම් කටයුතු පිළිබඳ දැනුම ලබා දීමත් අරමුණු කර ගනිමින් " චක්‍රිය ණය වැඩ සටහන හා ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ " වැඩ සටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 40 ක ප්‍රතිලාභීන් 2020 ක් සඳහා පවත්වන ලදි. වැය කරන ලද මුදල රු.මි.2.446 කි. |
| | | | කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් ඉතිරි කිරීම සඳහා පෙළඹවීමට ස්ථාපිත කැ ඇති වනිතා ශක්ති බැංකු වල කාර්යය මණ්ඩලය පුහුණු කිරීම, අධීක්ෂණ කටයුතු කිරීම මෙම වසරේද සිදු විය.බැංකු 23 ක් අධීක්ෂණය කර ඇති අතර රු.මි.0.1423 වැය කර ඇත. |
| | | | විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් විදේශගතවීම නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵල හා විදේශීයගතවීම වෙනුවට දේශීය වශයෙන් රැකියා අවස්ථා හඳුන්වා දීම සහ ඊට කාන්තාවන් උනන්දුකර වීම සඳහා වන වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි.මේ සඳහා රු.මි.1.9572 ක් වැය කර ඇති අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 ක වැඩ සටහන් පවත්වා ඇත |

| | | | |
|---|---|---|---|
| | | | ධීවර ප්‍රජාවන්හි කාන්තා කාර්ය සංවිධාන සමාජිකාවන්ගේ ආර්ථිකය නංවාලීම සඳහා දිරිය දැතට සවිය ධීවර කාන්තා වැඩ සටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8 ක ක්‍රියාත්මක කරන ලදි.මෙහිදී ධිවර කර්මාන්තයට අවශ්‍ය උපකරණ දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදනය කිරීම අරමුණ වන අතර රු මි.0.9360 වැය කර ඇත. |
| කාන්තාවන් සාමාජීය වශයෙන් සවිබල ගැන්වීම | 8.3 | 8.6213 | ශ්‍රී ලාංකේය කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඔවුන් වෙත නතු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම මෙහිදී සිදු කරනු ලබයි.මේ යටතේ,<br><br>01. රැකවරණ මධ්‍යස්ථාන<br>නීති විරෝධී මිනිස් වෙළදාමට හසු වූ දේශීය හා විදේශීය කාන්තා වින්දිතයින් හා ඔවුන්ගේ දරුවන් අදාළ ගැටළුව විසදෙන තෙක් ආරක්ෂිතව රඳවා තැබීම හා ඔවුනට රැකවරණය සැලසීම, උපදේශනය, නීතිමය කටයුතු සඳහා පහසුකම් සැලසීම, සෞඛ්‍ය පහසුකම් හා ඔවුන්ගේ මූලික අවශ්‍යතා සැපයීම.(ආහාර,ඇඳුම් )<br>රැකවරණ මධ්‍යස්ථාන 02 පවත්වාගෙන යනු ලබන අතර 2014 වර්ෂයේ දී ප්‍රතිලාභීන් 60 ක් වෙනුවෙන් රු .මි.0.3188 වැය කර ඇත.<br><br>02. උපදේශන වැඩ සටහන් හා උපදේශන මධ්‍යස්ථාන<br><br>පීඩාවටපත් වූ කාන්තාවන්ට හා ළමුන්ට මනෝ විද්‍යාත්මක උපදේශන ලබා දෙමින් ඔවුනට සේවා ලබා ගත හැකි පුද්ගයින් හා ආයතන වෙත යොමු කිරීමත් ජීවිතයේ පැන නගින ගැටළු විසදා ගැනීමේ මනෝ විද්‍යාත්මක ක්‍රම භාවිතයට හුරු කිරීමත් අරභයා උපදේශන මධ්‍යස්ථාන 12 ක් උපදේශන නිලධාරින් යටතේ පවත්වාගෙන යන අතර ඊට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා උපදේශන සහකාර නිලධාරීන් 275 දෙනෙකු අනුයුක්ත කර ඇත.2014 වර්ෂය තුළ දී පුද්ලයින් 745 දෙනෙකු සඳහා මනෝඋපදේශනය ලබා දී ඇත. තවද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 48 ක ප්‍රතිලාභීන් 7084 සඳහා උපදේශන වැඩ මුළු පවත්වා ඇති අතර ඒ සඳහා රු.මි.0.9978 ක් වැය කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | | 03. සමාජීය, ආර්ථික හා සංස්කෘතික වශයෙන් වතුකරයෙන් කාන්තාවන්ගේ තත්ත්වය ඉහල නැංවීම සඳහා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාවට නංවමින් පෝෂණය වැඩි දියුණු කිරීම,මත්ද්‍රව්‍ය නිවාරණය,විදේශගතවන වතුකරයේ කාන්තාවන් විකල්ප ආදායම් මාර්ග සඳහා පෙළඹවීම හා අධ්‍යාපනය,කුට්ටනය හා හිංසාව අවමකිරීම සඳහා වතු ප්‍රජාව වාසය කරන ප්‍රාදේශී ලේකම් කොට්ඨාස 56 ක ප්‍රතිලාභීන් 5311 සම්බන්ධකර ගනිමින් වැඩ සටහන් පැවැත්වීම.මේ සඳහා රු.මි.1.9896 ක් වැය කර ඇත.<br>04. නව යොවුන් වියේ ගැහැණු දරුවන්ගේ කුසලතාවය හා දැනුම වර්ධනය කිරීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 53 ක නව යෞවනියන් 7990 දෙනෙකු සම්බන්ධකර ගනිමින් වැඩ සටහන් පවත්වා ඇත. මේ සඳහා රු.මි.1.9623 ක් දරා ඇත.<br>05. කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ඔවුන්ගේ සංවර්ධනය වෙනුවෙන් කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කිරීමට සංවිධාන ජාලයක් බිහිකිරීම හා ඔවුන් නායකත්වයට පුහුණු කිරීම සඳහා පිහිටුවා ඇති ග්‍රාමීය මට්ටමේ වූ කාන්තා කාර්ය සංවිධාන , ප්‍රාදේශීය කාන්තා බල මණ්ඩල හා දිස්ත්‍රික් කාන්තා බල මණ්ඩල ශක්තිමත් කිරීම යටිතල පහසුකම් ඇතුළු සේවා සැපයීම.මේ සඳහා රු.මි.1.8209 වැය කර ඇත.<br>06. සුළු වැරදිමත බන්ධනාගාර ගත කාන්තාවන් නැවත නැවත එම වැරදි වලට යොමුවීම වලක්වා සමාජගත කිරීම සඳහා යාපනය, නුවර, කළුතර, ගාල්ල, පොළොන්නරුව, වැලිකඩ, මීගමුව, අනුරාධපුරය යන බන්ධනාගාර තුළ ප්‍රතිලාභීන් 380 ක් සඳහා වැඩ සටහන් 08 පවත්වා ඇත. මේ සඳහා රු.මි.0.2967 ක් වැය කර ඇත. |
| වෙනත් වැඩ සටහන් | 4.1 | 2.92515 | මාධ්‍ය හා පුස්තකාලය පවත්වාගෙන යාම,සංවර්ධන වැඩ සටහන් වල ප්‍රගති සමාලෝචන කටයුතු හා පසු විපරම් කටයුතු, ජාත්‍යන්තර කාන්තා දින ජාතික උත්සවයේ උත්සව කටයුතු හා ඊට සමගාමීව ප්‍රාදේශීය මට්ටමින් වැඩ සටහන් පැවත්වීම,ජත්‍යන්තර ගැහැණු දරුවාගේ දිනය, දැයට කිරුළ වැඩ සටහනට සමගාමී වැඩ සටහන් හා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩ සටහන් මේ යටතේ සිදු කර ඇත. |

# ජාතික කාන්තා කමිටුව

## දැක්ම

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු වූ, හිංසනයෙන් තොර, කාන්තාවන්ට හිතකර ශ්‍රී ලාංකික සමාජයක්

## මෙහෙවර

ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම,සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහලවන ප්‍රතිපත්ති හා නීති පද්ධතීන් සකස් කිරීම සඳහා නිර්දේශ හා සහාය ලබා දීම සහ නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට පෙළඹවීම හා අධීක්ෂණය කර ඇගයීම.

## ප්‍රධාන කාර්යභාරය

- ස්ත්‍රී පුරුෂභාවය මත ඇතිවන වෙනස්කම් පිළිබඳ වූ පැමිණිලි බාරගැනීම්, සංනිරීක්ෂණය හා ඒවා අදාළ පාලක, බලධාරීන්, සම්බන්ධිත තැනැත්තන් හෝ මණ්ඩල වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම.
- කාන්තා ප්‍රඥප්තියේ ඇතුළත් විධිවිධාන කඩ කිරීම සම්බන්ධයෙන් වන පැමිණිලි ,සහන, නෛතික ආධාර හෝ සමථ සේවා සඳහා රජයේ හෝ රජයේ නොවන හෝ සංවිධාන වෙත යොමු කිරීම.
- එම ක්‍රියාමාර්ග සමීක්ෂණය,අදාළ පාලන බලධාරීන්ගෙන් වාර්ෂික ප්‍රගති වාර්තා ලබා ගැනීම සහ එම වාර්තා රට තුළ ප්‍රචලිත කිරීම ආදියට අවස්ථා සැලසීම.
- ප්‍රඥප්තියේ අන්තර්ගතව ඇති පරිදි, කාන්තා අයිතිවාසිකම් සහ වගකීම් විෂයෙහි නෛතික සහ සංවර්ධන ප්‍රතිපත්ති වලින් ඇතිවන බලපෑම් ඇගයීම.
- අදාළ පර්යේෂණ දිරිගැන්වීම තුළින් ප්‍රඥප්තියේ අරමුණු සපුරා ගැනීමට උපකාරී විම සහ එම පර්යේෂණ පදනම් කර ගත් ප්‍රතිසංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳව විෂයභාර අමාත්‍යවරයා විසින් කමිටුවේ අවධානයට යොමු කෙරෙන කරුණු පිළිබඳව හෝ උචිතයයි කමිටුව සිතන කටයුතු, කිරීමට උපදෙස් දීම.

## 2014 වර්ෂයේ ක්‍රියාත්මක වූ වැඩ සටහන්

1. කාන්තාවන්ට සිදුවන හිංසන වැළැක්වීම සඳහා පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශයේ නිලධාරීන් දැනුවත් කිරීම.
2. උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමේ නිර්දේශ ප්‍රකාර, ඉන්දීය සම්භව වතු ප්‍රජාවගේ සමාජීය ආරක්ෂාව නංවාලීම උදෙසා වතු කළමනාකරුවන් හා ආශ්‍රිත නිලධාරීන් සංවේදී කිරීමේ අරමුණින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ වැඩ සටහන් පැවැත්වීම.
3. උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ආරක්ෂක අංශයේ අධිකාරීලත් ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා පොලිස් නිලධාරීන් සඳහා වන සම්මන්ත්‍රණය.
4. කාන්තා හිංසන වැළැක්වීමේ පරමාර්ථයෙන් සේවා ස්ථානයන්හි සිදුවන සැහැස් ක්‍රියා වැළැක්වීමේ අරමුණින් කාර්මික ක්ෂේත්‍රයේ සේවයේ නියුතු කාන්තාවන් පාදක කර වැඩසටහන් පැවැත්වීම.
5. කාන්තාවන්ට සිදුවන හිංසනය වැළැක්වීම උදෙසා ජංගම වැඩ සටහනක් පැවැත්වීම.

6. බල වයස් ගැබ් ගැනීම තුරන් කිරීමේ වැඩ සටහන.
7. කාන්තාවන්ට සිදුවන හිංසන වැලැක්වීම සඳහා දින 16 යේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.
8. දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා ප්‍රජා නායිකාවන් සඳහා වන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වීම.
9. 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව ශක්තිමත් කිරීම.

# ළමා ලේකම් කාර්යාලය

## දැක්ම

ශාරීරික ,මනෝ සමාජීය සහ ප්‍රජනන සංවර්ධනයෙන් යුතු ශ්‍රී ලාංකේය මුල් ළමාවිය දරු පරපුරක් බිහි කිරීම.

### මෙහෙවර

ජාතික මට්ටමේ කේන්ද්‍රීය ආයතනය ලෙස ප්‍රතිපත්ති හා වැඩ සටහන් සම්පාදනය,ක්‍රියාත්මක කිරීම,ඇගයීම හා පසු විපරම් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය දරුවන්ගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම.

### ප්‍රධාන කාර්යභාරය

- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ලෙස කටයුතු කිරිම.
- රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමාවිය සංවර්ධන වැඩ සටහන් සම්බන්ධීකරණය හා ජාලගත කිරිම.
- මුල් ළමාවිය සත්කාරය හා සංවර්ධනයට අදාළ වන පර්යේෂණ සිදු කිරිම, දත්ත රැස් කිරිම සහ වැඩ සටහන් සම්පාදනය කිරිම.
- මුල් ළමාවියේ දරුවාගේ සමස්ථ සංවර්ධනය සඳහා අදාළ වන පුහුණු වැඩ සටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරිම.
- මුල් ළමාවියේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරිම සහ ඔවුන් තුළ ඒ පිළිබඳ සංවේදීභාවයක් ඇති කිරීම.




## සමුච්ත මුල්‍ය ප්‍රගතියට අනුව භෞතික ප්‍රගතිය

2014 වර්ෂයේ දි කැකුළු උදානය යන අයිතමය යටතේ රු.23,000,000 අයවැය ඇස්තමේන්තු වෙන් වූ අතර රු.21,110,109 ක මුල්‍ය ප්‍රගතියක් අත්කර ඇත. මුල් ළමාවිය රැකවරණය අයිතම යටතේ රු.22,000,000 අයවැය ඇස්තමේන්තු වෙන් වූ අතර රු.17,904,892 ක මුල්‍ය ප්‍රගතියක් අත්කර ඇත.

| වැඩ සටහන | මුල්‍ය ඉලක්කය රු.මි | මුල්‍ය ප්‍රගතිය රු.මි | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 120-02-03-04(2502)-11 කැකුළු උදාන | 23.0002 | 21.111 | නිවස පදනම් කර ගත් මුල් ළමාවිය සංවර්ධන "සෙනෙහෙ තටාක "වැඩ සටහන ප්‍රතිලාභීන්16,271 අරභයා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කිරිම හා ළමා කේන්ද්‍රිය නිලධාරීන් 791 සඳහා දැනුවත් කිරීම් වැඩ සටහන් සිදුකර ඇත.මේ සඳහා රු.මි.1.7665 වැය කර ඇත. |
| | | | මුල් ළමාවිය දරුවන්ගේ ආහාර හා පෝෂණය පිළිබඳව දෙමාපියන් හා පෙර පාසල් ගුරුවරියන් දැනුවත් කිරිම සඳහා " පෝෂණ මංපෙත " වැඩ සටහන ක්‍රියාත්මක කිරිම.මේ සඳහා දෙමාපියන් 14309 සහභාගී වී ඇති අතර ඒ සඳහා රු.මි.1.47 වැයකර ඇත. |
| | | | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවරුන් 10072 ක පුහුණු හැකියාවන් සංවර්ධනය කිරිමත් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ලියාපදිංචි කිරිමත් සිදු කරන ලදි. මේ සඳහා රු.මි.2.6978 වැය වි ඇත. |
| | | | මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයට අදාළව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියලුම සේවාවන් ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරිම සඳහා රාජ්‍ය හා රජ්‍ය නොවන ආයතන සම්බන්ධිතවූ කමිටු පවත්වාගෙන යාම.මේ සඳහා රු.මි.0.436 වැය කර ඇත.<br>*මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධිකරණ කමිටුව<br>*මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ පළාත් සම්බන්ධිකරණ කමිටුව<br>*මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව<br>*මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුව<br>*මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ග්‍රාමීය සම්බන්ධිකරණ කමිටුව |
| | | | ටිකිරි මිතුරු මාධ්‍ය ප්‍රචාරක කටයුතු සහ ප්‍රකාශන සඳහා රු.මි.1.048 ක් වැය කර ඇත. |
| | | | ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය දරුවන්ගේ රැකවරණය හා සංවර්ධනයට අදාළ සියළු පාර්ශවදැනුවත් කිරිම හා ඔවුන්ගේ සංවේදීතාවය වර්ධනය කිරීම සඳහා දෙසැම්බර් 14 සිට 20 දක්වා මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය පැවැත්වීම.<br>මෙහිදී වැඩ මුළු, අධ්‍යාපන චාරිකා, අත්දැකීම් |

| | | | |
|---|---|---|---|
| | | | හුවමාරු වැඩ සටහන්,පෙරපාසල් අධ්‍යාපන උපකරණ ලබා දීම හා මුල් ළමාවිය රැකවරණය හා ආරක්ෂාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීම් වැනි ක්‍රියාකාරකම් සිදු වූ අතර ඒ සඳහා රු.මි.4.5 වැය කර ඇත. |
| 120-02-03-12(2502)-11<br>මුල් ළමාවිය රැකවරණය | 22.000 | 17.905 | පෙර පාසල් 27 ක මෙම වසර තුල සෙල්ලම් මිදුල් සාදා ඇති අතර ඒ සඳහා රු.මි.0.810 වැය කර ඇත.තවද, මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විශේෂ ව්‍යාපෘතියක් යටතේ රු.මි.1.190 ක් වැය කර සෙල්ලම් මිදුලක් ඉදි කර ඇත. |
| | | | පෙරපාසල් දරුවන්ට පානීය පිරිසිදු ජලය ලබා ගැනීම සඳහා පෙර පාසල් 61කට පානීය ජලය ලබා දීම. |
| | | | තෝරාගනු ලැබූ ග්‍රාම නිලධාරී වසම් වල තෝරාගනු ලැබූ ගම්මාන මුල් ළමාවිය සංවර්ධන ආදර්ශ ගම්මාන වශයෙන් ගම්මාන 10 ක් වැඩි දියුණු කිරීම.මේ සඳහා රු.මි.4.26 වැය කර ඇත. |
| | | | ළමා ලේකම් කාර්යාලයේ සම්පත් මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම,සෙත්සිරිපාය පරිශ්‍රය තුළ දිවා සුරැකුම් මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයන් ආශ්‍රිතව සම්පත් මධ්‍යස්ථාන ඉදි කිරීම. පෙර පාසල් සඳහා අධ්‍යාපන උපකරණ කට්ටල බෙදා දීම මෙම වසර තුලදී ඉතා සාර්ථකව සිදු කරන ලදි.මේ සඳහා රු.මි.5.495 ක් වැය කර ඇත. |